දුර්ලභ

# පොළොන්නරු යුගයේ සිංහල ව්‍යාඛ්‍යාන සාහිත්‍යය

(ක්‍රි.වර්ෂ 1058-1234 දක්වා රචිත සිංහල ව්‍යාඛ්‍යාන ග්‍රන්ථ පිළිබඳ ව විමර්ශනයක්)

මායාකඩුවේ ගුණසිරි හිමි

පුස්තකාලය
කැලණිය විශ්වවිද්‍යාලය (ශ්‍රී ලංකාව)
කැලණිය.

ප්‍රවිෂ්ට අංකය 63
වර්ග අංකය

දර්ශන විශාරද ( Ph.D. ) උපාධිය සඳහා කැලණි විශ්වවිද්‍යාලයට
ඉදිරිපත් කරන නිබන්ධය.

1984 ජනවාරි.

දූර්ලභ

## සැලැස්ම

අනුරපුර යුගයේ සිට මේ දක්වා සිංහල ව්‍යාඛ්‍යාන ග්‍රන්ථ රාශියක් රචිත ව ඇතත්, ඒ පිළිබඳ ව වියතුන්ගේ අවධානය යොමු වී ඇත්තේ ඉතා මඳ වශයෙනි. ධම්පියා අටුවා ගැටපදය, ධර්ම ප්‍රදීපිකාව, මහාබෝධිවංශ ග්‍රන්ථිපද විවරණය, ජාතක අටුවා ගැටපදය, විශුද්ධි මාර්ග සන්නය වැනි ව්‍යාඛ්‍යාන ග්‍රන්ථ කිහිපයක් හැරෙන විට සෙසු ග්‍රන්ථ සම්බන්ධයෙන් විමර්ශන පූර්වක ව ලියැවුණු තොරතුරු සොයා ගැනීම උගහට ය. සිංහල භාෂාවේත් සාහිත්‍යයේත් පෝෂණයට විශාල ආධාරයක් වූ ව්‍යාඛ්‍යාන ග්‍රන්ථ කෙරෙහි දක්වන සැලකිල්ල මීට වඩා වැඩි විය යුතුය. එහෙත් වියතුන් කීප පළකගේ විමසුම් ඇස යොමු වී ඇත්තේ එයින් ග්‍රන්ථ දෙක තුනක් ගැන පමණි. මේ සාහිත්‍යාංශයට සීමා වූ විශේෂ ග්‍රන්ථයක් මේ දක්වා ම බිහි නොවීම බලවත් පාඩුවකි. එම අඩුපාඩුව තරමක් දුරට හෝ මග හැරවීමට දරන ප්‍රයත්නයකි, මෙම පර්යේෂණ පූර්වක නිබන්ධය. මෙයින් අප වෑයම් කරන්නේ මේ ග්‍රන්ථාවලිය පිළිබඳ ව පරිපූර්ණ විශ්ලේෂණයක් කිරීමට නොව පොළොන්නරු යුගයට අයත් වන ව්‍යාඛ්‍යාන ග්‍රන්ථ ගැන විමර්ශනයක් කිරීමට ය.

මෙහි දී මූලාශ්‍රය ග්‍රන්ථ වශයෙන් අප පරිශීලනය කරන්නේ පොළොන්නරු අවදියට අයත් සිංහල ව්‍යාඛ්‍යාන ග්‍රන්ථයි. ඒ පිළිබඳ විස්තර මෙම නිබන්ධයේ දෙවැනි පරිච්ඡේදයෙන් දත හැකිය. එම ග්‍රන්ථ විමර්ශනය කොට එක් රැස් කර ගත් තොරතුරු මත මෙම පර්යේෂණය සිදු කෙරේ. මේ කාලය තුළ රචිත සිංහල ව්‍යාඛ්‍යානවල සඥාදි පංචකය, අර්ථ වර්ණනා ක්‍රම, භාෂා ලක්ෂණ, ව්‍යාඛ්‍යාන කතුවරුන්ගේ භාෂාන්තර ඥානය හා ග්‍රන්ථාන්තර ඥානය යන කරුණු පිළිබඳ ව විමර්ශනය කිරීම මෙහි මුඛ්‍යාධ්‍යාශයයි. මෙම ග්‍රන්ථාවලිය පරිශීලනය කිරීමේ දී හමු වූ අමතර කරුණු උපනිශ්‍රය කොට ගෙන සාමාජික හා ඓතිහාසික තොරතුරු යනුවෙන් පරිච්ඡේදයක් එක් කළේ අතිරේක විස්තරයක් වශයෙනි.

පුස්තකාලය
කැලණිය විශ්වවිද්‍යාලය (ශ්‍රී ලංකාව)
කැලණිය.

මෙහි මුල් පරිච්ඡේදයෙන් දැක්වෙන්නේ ව්‍යාඛ්‍යාන සාහිත්‍යයේ ප්‍රභවය හා සංවර්ධනය ගැන ය. සමාරම්භයක් ලෙස මෙම ග්‍රන්ථ ගණයේ පසුබිම දැක්වීම වැදගත් හෙයින් වෛදික යුගයේ සිට පොළොන්නරු යුගය දක්වා ව්‍යාඛ්‍යාන ග්‍රන්ථාවලිය විකාශනය වී ගිය අයුරු එහි දී විස්තර කෙරේ. ඓතිහාසික පසුබිම හා සාහිත්‍ය තත්ත්වය, සිංහල සාහිත්‍යයට ව්‍යාඛ්‍යාන අංශයක් එක්වීමට බල පෑ මූලාශ්‍රය, ව්‍යාඛ්‍යාන ග්‍රන්ථ යනු කුමක්ද?, හෙළටුවාවලින් පෙළටුවාවලට ලැබුණු ආභාසය, අනුරපුර යුගයේ සිට රචිත සිංහල ව්‍යාඛ්‍යාන ග්‍රන්ථ ගැන කෙටි හැඳින්වීමක් යන අනුමාතෘකා පහක් යටතේ දැක්වෙන තොරතුරු මගින් මුල් කාලයේ දී සංස්කෘත හා පාලි සාහිත්‍යවල ව්‍යාඛ්‍යාන කෙබඳු මුහුණුවරකින් පැවතුණිද යන්නත්, එමගින් සිංහල සාහිත්‍යයට ලැබුණු ආභාසයත් වෛදික ග්‍රන්ථ හා ත්‍රිපිටක ග්‍රන්ථ මූලාශ්‍රය කරගෙන විස්තර කෙරේ. මෙහි දී අප විශේෂයෙන් ම ප්‍රයත්න දරන්නේ වෛදික යුගයේ 'වේදාංග ශික්ෂා' යනුවෙන් පරිභාවිත ග්‍රන්ථවලින් පටන්ගෙන, ත්‍රිපිටක ග්‍රන්ථවල එන අර්ථ වර්ණනා ක්‍රම ගැන ලුහුඬින් දක්වා ඉන්පසු හෙළටුවාවල බලපෑම් ලත් පෙළටුවා රචකයන් විසින් අනුගමනය කරන ලද විවිධ අර්ථ වර්ණනා ක්‍රම පහදා දීමට ය. පරිච්ඡේදය අග භාගයේ දී අනුරපුර කල ලියැවුණු ධම්පියා අටුවා ගැටපදය සහ සිඛවළඳ හා සිඛවළඳ විනිස ගැනත් හැඳින්වීමක් එයි.

දෙවැනි පරිච්ඡේදය පොළොන්නරු යුගයට අයත් සිංහල ව්‍යාඛ්‍යාන ග්‍රන්ථ පිළිබඳ හැඳින්වීමක් සඳහා වෙන් වේ. අභිධර්මාර්ථ සංග්‍රහ සන්නය, මහා-බෝධි-වංශ ග්‍රන්ථිපද විවරණය ආදී ව්‍යාඛ්‍යාන ග්‍රන්ථ ගැන මෙහි දී විමසා බලන්නේ පැරණි ගත්කරුවන් ග්‍රන්ථ විවරණවල දී අනුගමනය කළ සඥා, නිමිත්ත, කර්තෘ, ප්‍රමාණය, ප්‍රයෝජනය යන කරුණු පහ මුල් කරගෙන ය. ජාතක අටුවා ගැටපදය, ධර්ම ප්‍රදීපිකාව වැනි ව්‍යාඛ්‍යාන ග්‍රන්ථ ගැන පමණි, පාඨකයාට බොහෝ විට විස්තර දැන ගැනීමට ඉඩකඩ ලැබෙන්නේ. එනිසා මෙහිදී එසේ තොරතුරු දැන ගැනීමට නොලැබෙන නිලීන ව තිබෙන වැදගත් ග්‍රන්ථ කීපයක් ගැන ද කරුණු අනාවරණය වේ. එමෙන් ම ප්‍රස්තුත සෑම ග්‍රන්ථයක ම භාෂා තත්ත්වය ගැන ද කරුණු ස්වල්පයක් යථාවකාශ පරිදි විමසුමට ලක් කෙරෙන්නේ, මෙයින් ඇතැම් ග්‍රන්ථ

සම්බන්ධ ව ඉදිරි පරිච්ඡේදවල දී දීර්ඝ වශයෙන් සාකච්ඡා නොවන නිසා ය.

සෙසු පරිච්ඡේදවලට වඩා දීර්ඝ වශයෙන් කරුණු සාකච්ඡා කෙරෙන තුන්වැනි පරිච්ඡේදය නම් කෙරෙන්නේ අර්ථ වර්ණනා ක්‍රම යනුවෙනි. මෙකල ව්‍යාඛ්‍යාන රචකයන් විසින් අනුගමනය කරන ලද ව්‍යාඛ්‍යාන ක්‍රමවලට බල පෑ පුරාතන අර්ථ වර්ණනා ක්‍රම ගැන මේ පරිච්ඡේදය ආරම්භයේ දී සාකච්ඡා කෙරේ. <u>නෙත්තිප්පකරණය</u>, <u>විසුද්ධිමග්ග ටීකා</u> වැනි පාලි අඨකථා කීපයක් මූලාශ්‍රය කරගෙන සංකාසන, පකාසන, විවරණ, විභජන, උත්තානීකම්ම, පඤ්ඤත්ති, අත්‍ථුද්ධාර, නිරුත්ති, වේවචන, ප්‍රත්‍යයොද්ධාර, ප්‍රත්‍යයාර්ථදීපන යන අර්ථ වර්ණනා ක්‍රම ගැන මෙහි දී සනිදර්ශන ව කරුණු දැක් වේ. අනතුරු ව මෙකල ව්‍යාඛ්‍යාන ග්‍රන්ථවල එන පදානුපදික පරිවර්තන, පාලි පදයකට පාලියෙන් අර්ථ කීම වැනි ව්‍යාඛ්‍යාන ක්‍රම පැහැදිලි කෙරේ.

සිව්වැනි පරිච්ඡේදය වෙන් වන්නේ ව්‍යාඛ්‍යාන ග්‍රන්ථවලින් හෙළිවන සාමාජික හා ඓතිහාසික තොරතුරු විමසා බැලීම පිණිස ය. රාජ්‍ය පාලනය, ආරක්ෂක සේනා, අධ්‍යාපනය යනාදී අනුමාතෘකා දහසයක් යටතේ මෙහිදී සමාජ තොරතුරු ඉදිරිපත් කෙරෙන අතර ඓතිහාසික තොරතුරු යන මැය යටතේ ඉන්දියාව හා ලංකාව සම්බන්ධ ඉතිහාස තොරතුරු පිළිබඳ ව මේ ග්‍රන්ථවල එන කරුණු සාකච්ඡාවට භාජන වේ. සමාජ තොරතුරු විමසීමේ දී මේ ග්‍රන්ථවලින් හෙළිවන අප්‍රකට කරුණු රාශියක් ද හෙළි - පෙහෙළි කෙරෙන අතර ඓතිහාසික තොරතුරු විමසීමේ දී වෙනත් සාහිත්‍ය ග්‍රන්ථවල සහ ඓතිහාසික මූලාශ්‍රයවල නොඑන වැදගත් තොරතුරු ව්‍යාඛ්‍යාන ග්‍රන්ථවල නිලීන ව පැවති අයුරු ද ප්‍රකට කෙරේ.

පස්වැනි පරිච්ඡේදයෙන් වෑයම් කරන්නේ ව්‍යාඛ්‍යාන කතුවරුන්ගේ ග්‍රන්ථාන්තර ඥානය සහ භාෂාන්තර ඥානය විමසා බැලීමට ය. ව්‍යාඛ්‍යානකරුවන් තම තමන්ගේ අර්ථ විවරණ සනාථ කිරීම සඳහා උපනිශ්‍රය කරගත් පරිබාහිර පාලි -සංස්කෘත ග්‍රන්ථ ගැන මෙහි දී කරුණු දැක් වේ. ව්‍යාඛ්‍යාන කතුවරුන් සතු ව පැවති විස්මයාවහ භාෂා ප්‍රභූත්වය සහ ධාරණ ශක්තිය කෙතරම් දැයි මෙහි එන නිදර්ශනවලින්

පැහැදිලි වේ. මෙම පරිච්ඡේදයේ අවසාන කොටසෙහි ව්‍යාඛ්‍යාන කතුවරුන්ගේ සමයාන්තර ඥානය ගැන ද ලුහුඬින් සඳහන් කිරීමට අදහස් කළේ මේ යුගයේ ව්‍යාඛ්‍යාන ග්‍රන්ථවල අන්තර්ගත වන ධර්මාවබෝධය පුළුල් කරන විස්තර කථනවලට ආශ්‍රය කරගත් ධම් ග්‍රන්ථ ගැනත් විමසිලිමත් වූ හෙයිනි.

සවැනි පරිච්ඡේදයෙන් කෙරෙන්නේ මේ යුගයේ සිංහල ව්‍යාඛ්‍යාන ග්‍රන්ථවල භාෂා ලක්ෂණ විමර්ශනයට ලක් කිරීමයි. පද යෝජනය, ව්‍යාකරණ ප්‍රවර්ග, වාක්‍ය වින්‍යාසය යන අනුමාතෘකාත්‍රය මත මේ පරිච්ඡේදය විකාශනය වේ. මෙහි ප්‍රස්තුතය වෙන ම පර්යේෂණයක් කිරීමට තරම් පුළුල්ය. එහෙත් මෙහි දී මෙකලට අයත් ව්‍යාඛ්‍යාන සමස්ත වශයෙන් සලකා කරුණු සාකච්ඡා කෙරෙන හෙයින් පද යෝජනයේ දී තසම සකුවදන් හා නුමුසු හෙළ වදන් මුසු පද යෝජනා ගැනත්, ව්‍යාකරණ ප්‍රවර්ග යටතේ ව්‍යාඛ්‍යාන කතුවරුන් ධාතු - ප්‍රත්‍යය වෙන් කොට දැක් වූ අයුරු, සමාස - විභක්ති - අව්‍යය පද වෙන් කොට විස්තර කළ අයුරු යන කරුණු ගැනත්, වාක්‍ය වින්‍යාසය යටතේ ධර්ම ප්‍රදීපිකාව, මහාබෝධිවංශ ග්‍රන්ථිපද විවරණය, අභිධර්මාර්ථ සංග්‍රහ සන්නය, ජාතක ගාථා සන්නය සහ වෙසතුරු දා සන්නය යන ව්‍යාඛ්‍යාන ග්‍රන්ථවල එන වාක්‍ය යෝජන විධි ගැනත් පැහැදිලි කෙරේ. ඉන්පසු සියලු ම පරිච්ඡේද සාරාංශ කරණය කොට එමගින් අප එළඹෙන නිගමනය දැක්වේ.

සිංහල භාෂා - සාහිත්‍ය විෂයෙහි ආසක්ත වූවකුට ව්‍යාඛ්‍යාන ග්‍රන්ථ පරම්පරාව ද බැහැර කළ නො හැකිය. එහි ලා අවධානයට නිසි පූර්වෝක්ත කරුණු සම්පිණ්ඩනය කොට විමර්ශනය කිරීම මේ නිබන්ධයේ මුඛ්‍යාර්ථය ලෙස හඳුන්වනු කැමැත්තෙමි.